# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2179/16 - 2020 ජූනි මස 10 වැනි බදාදා - 2020.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ඩීඅයිවීඅයිබී/එල්එන්ඩී/එල්ඒඩීඒකියු/සීඊපී/05/2015/03.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/එච්ඩබ්ලිව්/263.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශ්‍යතාවයේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 510, මැදගෙදර ග්‍රාම නිලධාරිවසමේ පිහිටි ඉහළ වල්පොල ගමෙහි සර්වේයර් ජනරාල්ගේ 2019.12.30 දිනැති අංක 1157 දරන මූලික පිඹුරේ, අතිරේක අංක 5, පත්‍ර අංක 5හි කැබලි අංක 356 - 357 (කැබලි 02 ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1070 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

1. **කැබලි අංක 356**

ඉඩමේ නම: කුඩාඹය වත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මු.පි. 5072 කැබලි (කොටස්) අංක 15, මු.පි. 6485 කැබලි (කොටස්) අංක 4. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අදියර IV සඳහා අවශ්‍ය වී ඇත. (ව.මී.891); ප්‍රමාණය: හෙක්. 0.0891.

2. **කැබලි අංක 357**

ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: රත්විට ඇළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මු.පි. 5072 කැබලි (කොටස්) අංක 22, ඇළෙන් අර්ධය. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අදියර IV සඳහා අවශ්‍ය වී ඇත. (ව.මී.179); ප්‍රමාණය: හෙක්. 0.0179.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ජූලි මස 10 වැනි දින පෙ. ව. 9.30 ට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020 ජූලි මස 03 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩී. පී. එස්. කුමාර,  
ප්‍රාදේශීය ලේකම්,  
ඉබ්බාගමුව.

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-194

1A - G 32313 - 22 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.